# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත

---

[සහතිකය සටහන් කලේ 1998 අප්‍රේල් මස 29 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1998 අප්‍රේල් මස 30 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 20.25 යි. තැපැල් ගාස්තුව : රු. 3.75 යි.

## 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත

[සහතිකය සටහන් කළේ 1998 අප්‍රේල් මස 29 වන දින.]

එල්. ඩී.-ඕ. 62/94.

**ඉඩම් කොටසක් පිළිබඳව හිමිකම් විමර්ශනය කිරීමේ හා ලියාපදිංචි කිරීම සඳහා ද : එසේ ලියාපදිංචි කරන ලද ඉඩම් කොටස්වලට අදාළ ගණුදෙනු විධිමත් කිරීම සඳහා ද : ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා ද: විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් කලින් කල මේ පනත අදාළ විය යුතු ප්‍රදේශයක් ලෙස අමාත්‍යවරයා විසින් සඳහන් කරනු ලබන පරිදි, යම් පළාතකට, පරිපාලන දිස්ත්‍රික්කයකට හෝ පරිපාලන කොට්ඨාසයකට මේ පනත අදාළ විය යුතු ය.

*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.*

### මූලික කරුණු

**2.** මේ පනත යටතේ තමා වෙත පවරනු ලබන කාර්ය හා කර්තව්‍ය නිසි ලෙස ඉටු කිරීම සඳහා වගකිවයුතු, හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයකු සහ අවශ්‍ය පරිදි නියෝජ්‍ය හා සහකාර හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයන් යම් සංඛ්‍යාවක් පත් කරනු ලැබිය යුතු ය.

*හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා.*

**3.** (1) මේ පනතේ කාර්ය සඳහා හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයකු පත් කරනු ලැබිය යුතු ය.

*හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා සහ හිමිකම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය.*

(2) හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් එක් එක් දිස්ත්‍රික්කයෙහි හිමිකම් ලියාපදිංචි කිරීමේ කාර්යාල පවත්වා ගෙන යා යුතු අතර, ඒවායෙහි, මේ පනතේ 1 වන වගන්තිය යටතේ කරන ලද නියමයක නිශ්චිතව සඳහන් වන සහ ඒ දිස්ත්‍රික්ක තුළට අයත් වන යම් ප්‍රදේශයක් ඇතුළත පිහිටි ඉඩම්වලට ඇති හිමිකම් ලියාපදිංචි කිරීමේ කාර්ය සඳහා නියෝග මගින් නියමිත රෙජිස්ටර පවත්වා ගෙන යනු ලැබිය යුතු ය.

(3) හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ විධානය යටතේ ක්‍රියා කිරීම පිණිස ඒ එක් එක් හිමිකම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයකට හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයකු පත් කරනු ලැබිය යුතු ය.

2—D 038747—5,900 (95/12)

ලේඛනගත කිරීමේ ඒකකය.

4. 3 වන වගන්තිය යටතේ පවත්වා ගෙන යන හිමිකම් රෙජිස්ටරයක ලේඛනගත කරනු ඒකකය කැඩැස්තර සිතියමේ සලකුණු කර ඇති ඉඩම් කොටසක් විය යුතු ය.

ලියාපදිංචි කිරීමේ ස්වභාවය.

5. ලියාපදිංචි කිරීම, ඒ ඉඩම් කොටසේ හිමිකමට අදාළ නියමිත විස්තර, හිමිකම් රෙජිස්ටරයේ සටහන් කිරීමෙන් ක්‍රියාත්මක කළ යුතු ය.

සියලු නිලධරයන් රජයේ සේවකයන් විය යුතු බව.

6. මේ පනතේ කාර්ය සඳහා පත් කරනු ලබන සියලු ම නිලධරයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රජයේ නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු ය

සමගි මණ්ඩලය.

7. (1) මේ පනතේ 1 වන වගන්තිය යටතේ කරන ලද නියමයක නිශ්චිතව සඳහන් යම් ප්‍රදේශයක් තුළ වූ එක් එක් ග්‍රාම නිලධාරි කොට්ඨාසයක් සඳහා හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා විසින් සමගි මණ්ඩලයක් පත් කරනු ලැබිය හැකි ය.

(2) ඒ එක් එක් සමගි මණ්ඩලයක් –

(අ) ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත පදිංචිව සිටින ඉඩම් හිමියන් අතුරෙන් තෝරා ගත් තුන් දෙනකුට නොඅඩු සහ හත්දෙනකුට නොවැඩි සාමාජිකයන් සංඛ්‍යාවකින් ; සහ

(ආ) ඒ එක් එක් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරීගෙන් සමන්විත විය යුතුය.

(3) ඒ එක් එක් මණ්ඩලයක් විසින්, ඔවුන් අතුරෙන් සභාපතිවරයකු හා ලේකම්වරයකු තෝරා පත් කරගනු ලැබිය යුතු ය.

සමගි මණ්ඩලවලට යොමු කිරීම.

8. යම් ඉඩමක කොටසකට අදාළ යම් ආරවුලක්, ඒ ඉඩම පිහිටි ප්‍රදේශය සඳහා පත් කරන ලද සමගි මණ්ඩලය විසින් නිරවුල් කිරීම සඳහා හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා විසින් ඒ සමගි මණ්ඩලයට යොමු කරනු ලැබිය හැකි ය.

සමගි මණ්ඩලවල බලතල හා කාර්යය.

9. (1) සමගි මණ්ඩලය විසින් 8 වන වගන්තිය යටතේ එය වෙත කරනු ලැබූ යොමු කිරීමක් මත, ඒ සමගි මණ්ඩලය පත් කරනු ලැබූ ප්‍රදේශය තුළ පිහිටි ඉඩම් කෙරෙහි සම්බන්ධතාවක් ඇති යම් තැනැත්තකුට ඒ ඉඩම් සම්බන්ධයෙන් වූ යම් ආරවුලක් විසඳා ගැනීම පිණිස සහාය විය යුතු ය.

## හිමිකම් ලියාපදිංචි කිරීම

### මූලික සම්පාදනය

10. මේ පනත යටතේ සෑම ඉඩම් කොටසකට හිමිකම් ලියාපදිංචි කිරීම, තත් කාර්ය සඳහා සකස් කරන ලද කැඩැස්තර සිතියම අනුව විය යුතු ය.

*ඉඩම් කොටසකට හිමිකම් ලියාපදිංචි කිරීම කැඩැස්තර සිතියමට අනුකූලව විය යුතු බව.*

11. මේ පනතේ 1 වන වගන්තිය යටතේ, නියමයක් පළ කිරීමෙන් පසු, ඒ නියමයෙහි නිශ්චිතව සඳහන් ප්‍රදේශය සඳහා කැඩැස්තර සිතියම් සකස් කරන ලෙස, හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා විසින් මිනුම්පතිවරයාගෙන් ඉල්ලා සිටිය යුතු අතර, ඒ ඉල්ලීම කිරීමෙන් පසු, මිනුම්පතිවරයා විසින් ඒ කැඩැස්තර සිතියම් පිළියෙල කරනු ලැබීමට සැලැස්විය යුතු ය. තව ද ඒවායේ සහතික පිටපත් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා වෙත නිකුත් කරනු ලැබීමට සැලැස්විය යුතු ය.

*කැඩැස්තර සිතියම් සකස් කිරීම.*

12. ඒ කැඩැස්තර සිතියම්වල සහතික පිටපත් ලැබීමෙන් පසු, හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා විසින්, ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් ඉඩම් කොටසකට හිමිකම් පාන්නන් විසින් නියමිත කාලය ඇතුළත ඔවුන්ගේ හිමිකම් පෑම් තමා වෙත ඉදිරිපත් කරන ලෙස ඉල්ලමින් දැන්වීමක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

*දැන්වීම් පළ කිරීම.*

13. හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා විසින් 12 වන වගන්තිය යටතේ වූ දැන්වීමකට පිළිතුරු වශයෙන් ඉදිරිපත් කරනු ලබන හිමිකම් පෑම්වල අව්‍යාජත්වය හෝ අන්‍යාකර බව තීරණය කිරීම පිණිස විමර්ශනයක් කිරීමට සැලැස්විය යුතු ය.

*විමර්ශන කිරීම.*

14. 12 වන වගන්තිය යටතේ වූ විමර්ශන අවසන් කිරීමෙන් පසු හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා විසින් ඒ මත වූ ඔහුගේ තීරණය පහත දැක්වෙන අන්දමට ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය :—

*හිමිකම් ප්‍රකාශය පළබඳ නියමය.*

(අ) ඉඩම් කොටසකට හිමිකම් පාන්නාට ඒ කොටසට පරම අයිතිය පිළිබඳ හිමිකම් ඇති බව හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයාගේ මතය වන අවස්ථාවක, 'ඒ හිමිකම් පාන්නාට පරම අයිතිය පිළිබඳ ප්‍රථම පංතියේ හිමිකමක් ඇති ලෙස ලියාපදිංචි කරවා ගැනීමට සුදුසුකම් ඇති බවට ඔහු විසින් ප්‍රකාශයක් කළ යුතු ය :

(ආ) හිමිකම්පාන්නකු පරම අයිතිය පිළිබඳ ප්‍රථම පංතියේ හිමිකමකට සුදුසුකම් නොලබන නමුත්, හිමිකම් පාන්නාට ඉඩම් කොටසෙහි සද්භාවයෙන් සන්තකය ඇති බව හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයාගේ මතය වන අවස්ථාවක, හිමිකම් පාන්නාට පරම අයිතිය පිළිබඳ දෙවන පංතියේ හිමිකමක් ලියාපදිංචි කරවා ගැනීමට හිමිකම් තිබේ යයි ද ඒ ඉඩම් කොටස ඒ තත්ත්වයෙන් ලියාපදිංචි කිරීමේ දිනයේ සිට එහි අඛණ්ඩ හා අභියෝග නොකළ සන්තකය අවුරුදු දහයක කාලසීමාවක් දැරීමෙන් පසු ඒ කාලසීමාව අවසානයේ දී, ඒ දෙවන පංතියේ හිමිකම, අයිතිය පිළිබඳ ප්‍රථම පංතියේ හිමිකමක් සහිත ලියාපදිංචි කිරීමකට පරිවර්තනය කරවා ගැනීමේ අයිතිය, සමග විය යුතු යයි ද නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා විසින් ප්‍රකාශ කරනු ලැබිය හැකි ය:

(ඇ) හිමිකම්පාන්නකු විසින්, හිමිකම් පාන ඉඩම් කොටසින් පංගුවකට පමණක් හිමිකම් පෑමක් තහවුරු කර ඇති බව, හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයාගේ මතය වන අවස්ථාවක, ඒ හිමිකම්පාන්නා අවස්ථාවෝචිත පරිදි, ඒ ඉඩම් කොටසේ බෙදා වෙන් කළ කොටසකට පරම අයිතිය පිළිබඳ ප්‍රථම පංතියේ හිමිකමකට හෝ අයිතිය පිළිබඳ දෙවන පංතියේ හිමිකමකට සුදුසුකම් ලබන බවට ඔහු විසින් ප්‍රකාශ කරනු ලැබිය යුතු ය;

(ඈ) බෙදා වෙන් කළ ඉඩම් කොටසක විශාලත්වය නියමිත ආර්ථික ඒකකයකට වඩා අඩු නොකොට ඒ හිමිකම් පැමිටලිස් එකක් හෝ වැඩි ගණනක් පිළිගැනීමට නොහැකි බව හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයාගේ මතය වන අවස්ථාවක, ඒ ඉඩම් කොටසට වලංගු හිමිකම් පෑමක් ඇති සියලු හිමිකම්පාන්නන්, ඒ එක් එක් හිමිකම්පාන්නාගේ සම අයිතියේ ප්‍රමාණයට, සම අයිතිය පිළිබඳ හිමි කමක් සහිතව සම අයිතිකරුවන් වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා සුදුසුකම් ලබන බවට ඔහු විසින් ප්‍රකාශයක් කළ යුතු ය.

කළමනාකරු පත් කිරීම, බලතල හා කාර්ය.

15. (1) 14 වන වගන්තියේ (ඇ) ඡේදය යටතේ සම අයිතිය පිළිබඳ හිමිකමක් ලියාපදිංචි කිරීමේ දී ඒ සම අයිතිකරුවන් බහුතරයක කැමැත්ත ඇතිව හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා විසින් ඒ සම අයිතිකරුවන් අතුරෙන් එක් තැනැත්තකු ඒ සම අයිතිය ඇති ඉඩම් කොටසේ කළමනාකරු වශයෙන් පත් කරනු ලැබිය හැකි ය.

(2) ඒ කළමනාකරුට (87 වන අධිකාරය වූ) භාර ආඥාපනත යටතේ භාරකරුවකු සතු අධිකාරය, බලය හා බැඳීම් තිබිය යුතු ය.

(3) කළමනාකරුවකුගේ කාර්යවලට පහත දැක්වෙන කාර්ය ඇතුළත් විය යුතුය:—

(අ) එකී ඉඩම් කොටස, උපරිම ඵලදාව ලබා ගැනීමෙහි ලා හිතකර තත්ත්වයකින් පවත්වා ගෙන යාම ;

(ආ) වියදම් කිසිවක් සහ ඒ කළමනාකරණය සඳහා ඔහුට අය විය යුතු ගාස්තු හිලව් කර ගැනීමෙන් පසු, ඒ ඉඩම් කොටසින් උපචිත වන ලාභ ඔවුන්ගේ සම අයිතියේ අර්ථලාභීන්ගේ කොටස් අනුව ඔවුන් අතර බෙදා දීම.

(4) කළමනාකරුගේ බලතල අතරට, ඒ ඉඩම් කොටස සංවර්ධනය කිරීම සඳහා අරමුදල් සපයා ගැනීම පිණිස සම අයිතිකරුවන්ගේ කැමැත්ත ඇතිව, ඒ කොටස උකස් කිරීමට ඇති බලය ද ඇතුළත් වන්නේ ය.

සම අයිතිකරුවන්ගේ අයිතිවාසිකම්.

16. (1) සම අයිතිකරුවන්ට (87 අධිකාරය වූ) භාර ආඥාපනත යටතේ අර්ථලාභීන්ට ඇති අයිතිවාසිකම් තිබිය යුතු ය.

(2) අර්ථලාභීන්ගේ අයිතිවාසිකම් අතරට, එක ඉඩම් කොටසින් ලාභ ලැබීමට ඇති අයිතිවාසිකම් ද ඇතුළත් වන්නේය.

අර්ථලාභීන් විසින් අලුත් කළමනාකරුවකු පත් කරන ලෙස ඉල්ලා සිටිය හැකි බව.

17. පහත දැක්වෙන හේතු මත, සම අයිතිය දරන ඉඩම් කොටසේ කළමනාකරු වශයෙන් වෙනත් සම අයිතිකරුවකු පත් කරන ලෙස අර්ථලාභීන් විසින් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයාගෙන් ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය:—

(අ) කළමනාකරුගේ අයථා කළමනාකරණය හෝ අසද්භාවයෙන් කටයුතු කිරීම ; හෝ

(ආ) ඉඩම් කොටස උපරිම ප්‍රයෝජනයට නොයෙදීම.

අලුත් කළමනාකරුවකු පත්කිරීමට හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයාට ඇති බලය.

**18.** හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා විසින්, සම අයිතිකරුවන් බහුතරයක කැමැත්ත ඇතිව, එකී ඉඩම් කොටස කළමනාකරණය කිරීම පිණිස ඒ සම අයිතිකරුවන් අතුරෙන් අලුත් කළමනාකරුවකු පත්කිරීම–

(අ) කළමනාකරු අයථා කළමනාකරණය හෝ අසද්භාවය සම්බන්ධයෙන් වැරදිකරු බවට සෑහීමකට පත්වීමේ දී:

(ආ) ඉඩම් කොටස උපරිම ප්‍රයෝජනයට යොදා නොමැති බවට සෑහීමට පත්වීමේ දී :

(ඇ) කළමනාකරු මරණයට පත් වූ විට ; හෝ

(ඈ) එසේ කිරීම සම අයිතිකරුවන්ගේ උපරිම යහපත සඳහා බව හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයාගේ මතය වන අවස්ථාවක

කරනු ලැබිය යුතු ය.

රජයේ ඉඩම් ලියාපදිංචි කිරීම.

**19.** ලියාපදිංචි කිරීමට අපේක්ෂා කරනු ලබන ඉඩම රජයේ ඉඩමක් වන අවස්ථාවක, හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා විසින්, අවස්ථාවෝචිත පරිදි යම් බැහැර කිරීමේ, වෙන් කිරීමේ හෝ කැප අයිතීන් පිළිබඳ විස්තර ද සමග ඒ ඉඩම සම්බන්ධයෙන් රජයට ඇති පරම අයිතිය පිළිබඳ එම ප්‍රකාශයේ හිමිකම ලියාපදිංචි කිරීම සඳහා හිමිකම් පිළිබඳ උපලේඛනයක් පිළියෙල කරනු ලැබිය යුතු ය.

ඉඩම් කොටසට ඇති සම්බන්ධතාව ලියාපදිංචි කිරීම.

**20.** හිමිකම් පාන්නකු විසින්, මේ පනතේ විධිවිධාන යටතේ ලියාපදිංචි කිරීමට ඇති ඉඩම් කොටසක අයිතියට හෝ එහි සම්බන්ධතාවට තමාට ඇති හිමිකම් පෑම තහවුරු කර ඇති බව, හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයාගේ මතය වන අවස්ථාවක, ඒ ඉඩම් කොටසේ සම්බන්ධතාවේ අයිතිකරු වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා ඒ හිමිකම්පාන්නා සුදුසුකම් ලබන බවට, කොමසාරිස්වරයා විසින් ප්‍රකාශයක් කළ යුතු අතර, ඒ සම්බන්ධතාව පවත්නා තාක් වූ කාලය සඳහා ඒ සම්බන්ධතාව හිමිකම් පිළිබඳ රෙජිස්ටරයේ ලියාපදිංචි කළ යුතු ය:

එසේ වුවද, මේ පනත යටතේ අයිතිකරුවකු වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා සුදුසුකම් ලබා ඇති බවට ප්‍රකාශ කරන ලද තැනැත්තකු යම් විශේෂ හෝ පුද්ගල නිතියකට යටත් බව හෝ එයින් පාලනය කෙරෙන බව හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයාගේ මතය වන අවස්ථාවක, ඒ තැනැත්තා ඒ විශේෂ හෝ පුද්ගල නීතියට යටත් බව ඔහු විසින්, ප්‍රකාශ කොට, ඒ කරුණ පිළිබඳව හිමිකම් පිළිබඳ රෙජිස්ටරයේ සටහනක් යෙදීමට සැලැස්විය යුතු ය.

හිමිකම් පෑම දිසා අධිකරණයට යොමු කිරීම.

**21.** විමර්ශනය කර ගෙන යනු ලබන අතරතුර දී හිමිකම්පෑම්වල ආරවුල් සහගත ස්වභාවය හේතු කොටගෙන විමර්ශන කටයුතු දිසා අධිකරණය විසින් කරගෙන යාම වඩා උචිත බව, හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයාගේ මතය වේ නම්, ඉඩම පිහිටි ප්‍රදේශය විෂයයෙහි අධිකරණ බලය ඇති දිසා අධිකරණය වෙත ඒ හිමිකම්පෑම් විමර්ශනය කොට තීරණය කිරීම සඳහා හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිසවරයා විසින් යොමු කරනු ලැබිය හැකි ය.

අතෘප්තියට පත් හිමිකම් පාන්නකු විසින් දිසා අධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි බව.

**22.** 14 වන වගන්තිය යටතේ වූ හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයාගේ යම් ප්‍රකාශයකින් අතෘප්තියට පත් යම් හිමිකම්පාන්නකු විසින්, ඒ ප්‍රකාශයට විරුද්ධව ඉඩම් කොටස පිහිටි ප්‍රදේශය විෂයයෙහි අධිකරණ බලය ඇති දිසා අධිකරණය වෙත නියමිත කාලය ඇතුළත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

අතිරේක මැනීම්.

**23.** (1) පසුව කරන ලද තීරණ පෙන්නුම් කිරීම පිණිස කැඩැස්තර සිතියම සඳහා යම් අතිරේක මැනීම් අවශ්‍ය බව, හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයාගේ මතය වන අවස්ථාවක, ඒ අතිරේක මැනීම් කරන ලෙස සහ මායිම් සම්බන්ධයෙන් අවශ්‍ය විග්‍රහ කරන ලෙස, ඔහු විසින් මිනුම්පතිවරයාගෙන් ඉල්ලා සිටිය යුතු ය.

(2) මිනුම්පතිවරයා විසින් මායිම් පිළිබඳව අවශ්‍ය විග්‍රහ කිරීම් කළ යුතු අතර, හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා විසින් නියම කරන ලද එවැනි මැනීම් මිනුම්පතිවරයා විසින් සිදුකොට, ඔහු විසින් සංශෝධිත කැඩැස්තර සිතියමක් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

**24.** දිසා අධිකරණයක් වෙත 21 වන වගන්තිය යටතේ යොමු කිරීමක් කර ඇති හෝ 22 වන වගන්තිය යටතේ අභියාචනයක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක, නිසි විභාගයකින් පසු දිසා අධිකරණය විසින් පහත දැක්වෙන ආඥා අතුරෙන් එක් ආඥාවක් හෝ ඊට වැඩි ආඥා ගණනක් කරනු ලැබිය හැකි ය:—

(අ) 14 වන වගන්තියට අනුකූලව හිමිකම් පාන සම්පූර්ණ කොටස සම්බන්ධයෙන් හෝ ඉඩම් කොටසේ බෙදා වෙන් කරන ලද පංගුවක් නියමිත අවම විශාලත්වයට අඩු නොවීමට යටත්ව, ඒ පංගුව සම්බන්ධයෙන් හිමිකම් පාන්නකුගේ වාසියට හිමිකම් පිළිබඳ ප්‍රකාශයක් ආඥා කිරීම ;

(ආ) සම්පූර්ණ ඉඩම් කොටස හෝ ඒ බෙදා වෙන් කරන ලද පංගුවක්, නියමිත අවම විශාලත්වයට අඩු නොවීමට යටත්ව, ඒ පංගුව හිමිකම්පාන්නන් අතර විකුණන ලෙස ආඥා කිරීම ;

(ඇ) අධිකරණය උචිත යයි සලකන පරිදි එක් එක් හිමිකම් පාන්නා හෝ හිමිකම්පාන්නන් අතුරෙන් කිසිවකු විසින් ගෙවිය යුතු නඩු ගාස්තු නියම කිරීම.

මිනුම්පතිවරයා වෙත අධිකාර පත්‍රය නිකුත් කිරීම.

**25.** (1) මේ පනතේ විධිවිධාන යටතේ දිසා අධිකරණයක් වෙත කරන ලද යොමු කිරීමක් හෝ අභියාචනයක් මත, ඒ අධිකරණය විසින් යම් අතිරේක මැනීම් කිරීම පිණිස සහ ඒ අධිකරණයේ ආඥා බලාත්මක කිරීම සඳහා අවශ්‍ය වන කැඩැස්තර සිතියම් සංශෝධනය කිරීම පිණිස, මිනුම්පතිවරයා වෙත අධිකාර පත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) මිනුම්පතිවරයා විසින් ඒ අධිකාර පත්‍රය ක්‍රියාත්මක කොට ඒ අධිකාර පත්‍රයට සම්බන්ධ ඔහුගේ වාර්තාව ඉදිරිපත් කළ යුතු ය. තව ද, ගාස්තු පිළිබඳ බිල් පත්‍රයක් සමග ඔහු විසින් ගන්නා ලද ක්‍රියාවලට අදාළ සවිස්තර වාර්තාවක් ද දිසා අධිකරණය වෙත යැවිය යුතු ය.

(3) අධිකාර පත්‍රයට සම්බන්ධ ඒ වාර්තාව දිසා අධිකරණය වෙත ලබාදීමේ දී, මිනුම්පතිවරයා විසින් ඉදිරිපත් කර ඇති ගාස්තු පිළිබඳ බිල්පත්‍රවල දක්වා ඇති පරිදි වූ මිනුම් ගාස්තු, හිමිකම් පාන්නන් විසින් ගෙවිය යුතු බවට දිසා අධිකරණය විසින් ආඥාවක් කරනු ලැබිය යුතු ය.

(4) දිසා අධිකරණය විසින් විකිණීමක් කරන ලෙස ආඥා කර ඇති අවස්ථාවක, ඒ විකිණීම සඳහා බලයලත් වෙන්දේසිකරුවකු වෙත අධිකාර පත්‍රයක් නිකුත් කළ යුතු ය. ඒ වෙන්දේසිකරු විසින් තත් කාර්යය සඳහා සාදනු ලබන නියෝගවල නියමිත පරිදි විකිණීම පවත්වා, ඒ අධිකාර පත්‍රය සම්බන්ධ ඔහුගේ වාර්තාව ඉදිරිපත් කළ යුතු ය.

(5) අධිකාර පත්‍රය සම්බන්ධ ඒ වාර්තාව ලැබීමේ දී, දිසා අධිකරණය විසින්, ඉහළම ලංසුව තැබූ තැනැත්තාට මිලට ගැනීමේ දී මුදල සහ වෙන්දේසිකරුගේ ගාස්තු අධිකරණයේ තැන්පත් කරන ලෙස ආඥා කළ යුතු ය.

(6) මිනුම් ගාස්තු, මිලට ගැනීමේ මුදල හා වෙන්දේසිකරුගේ ගාස්තු තැන්පත් කරනු ලැබූ විට, දිසා අධිකරණය විසින් –

(අ) (i) මිනුම් ගාස්තු මිනුම්පතිවරයා වෙත ගෙවන ලෙස ;

(ii) මිලට ගැනීමේ මුදල, අදාළ හිමිකම්පාන්නන් අතර ඔවුන්ගේ හිමිකම් පැමිවලට අනුකූලව බෙදා දෙන ලෙස ; සහ

(iii) වෙන්දේසිකරුගේ ගාස්තු අදාළ බලයලත් වෙන්දේසිකරුට ගෙවන ලෙස

ආඥා කළ යුතු ය :

(ආ) විනිශ්චය කරනු ලැබූ ඉඩම් කොටස්වල හිමිකම සඳහන් කරමින් තීන්දු ප්‍රකාශය ඇතුළත් කළ යුතු ය :

(ඇ) ඒ තීන්දු ප්‍රකාශයේ පිටපතක් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා වෙත යැවිය යුතු ය.

විමර්ශන අවසානයේ දී හිමිකම් පිළිබඳ උපලේඛන හිමිකම් රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතු බව.

**26.** මේ පනතේ 13 හා 21 වන වගන්තිවල සඳහන් විමර්ශන හෝ 22 වන වගන්තියේ නිශ්චිතව සඳහන් අධිකරණ කටයුතු අවසන් කිරීමෙන් පසු හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා විසින් හිමිකම් පිළිබඳ උපලේඛන පිළියෙල කොට ඒ උපලේඛන ස්වකීය ලේඛන ප්‍රතිශෝධනය කර ගැනීම සඳහා මිනුම්පතිවරයාට පිටපතක් සමග උචිත හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා වෙත යවනු ලැබිය යුතු ය.

උපලේඛනවල ඇතුළත් කරුණු රෙජිස්ටරයේ ඇතුළත් කළ යුතු බව.

**27.** (1) 26 වන වගන්තියේ සඳහන් හිමිකම් පිළිබඳ උපලේඛන ලැබීමෙන් පසු, හිමිකම් රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ උපලේඛනවල ඇතුළත් කරුණු, මේ පනතේ විධිවිධාන යටතේ ඔහු විසින් පවත්වාගෙන යනු ලබන හිමිකම් රෙජිස්ටරවල ඇතුළත් කරවීමට සැලැස්විය යුතු ය.

(2) ඒ ඇතුළත් කිරීම්, මේ පනතේ විධිවිධාන යටතේ ඉඩම් කොටස්වලට හිමිකම් ලියාපදිංචි කිරීමට අදාළ මූලික ඇතුළත් කිරීම් විය යුතු ය.

මේ පනත යටතේ ලියාපදිංචි කරන ලද ඉඩම් කොටසට අදාළ ගනුදෙනු ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ ඇතුළත් නොකළ යුතු බව.

**28.** මේ පනතේ හිමිකම් රෙජිස්ටර විවෘත කිරීම ආරම්භ වූ දිනයේ සිට, මේ පනත යටතේ ලියාපදිංචි කරන ලද ඉඩම් කොටස්වල අදාළ ගනුදෙනු, (117 වන අධිකාරය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ පවත්වා ගෙන යනු ලබන ඉඩම් රෙජිස්ටරවල ඇතුළත් නොකළ යුතු නමුත් ඒ රෙජිස්ටරවල ඒ ඉඩම් කොටස්වලට අදාළ වූ සහ මේ පනතේ විධිවිධාන යටතේ පවත්වා ගෙන යනු ලබන්නා වූ හිමිකම් රෙජිස්ටරවලට හරස් යොමු සටහනක් තිබිය යුතු ය.

ලියාපදිංචි කිරීම පිළිබඳව අතෘප්තියට පත් තැනැත්තකු විසින් දිසා අධිකරණය වෙත ඉල්ලුම් කළ හැකි බව.

**29.** (1) යම් ඉඩම් කොටසක අයිතිය පිළිබඳ දෙවන පන්තියේ හිමිකමක් සහිතව තැනැත්තකුගේ හිමිකම් ලියාපදිංචි කිරීමකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් ඒ ලියාපදිංචි කිරීම කරන ලද දිනයේ සිට අවුරුදු දහයක කාලයක් ඇතුළත දී, රෙජිස්ටරය සංශෝධනය කිරීම සඳහා නඩුවක් ඒ ඉඩම් කොටස පිහිටි ප්‍රදේශය විෂයයෙහි අධිකරණ බලය ඇති අධිකරණයෙහි පවරනු ලැබිය හැකි ය.

(2) ඒ නඩුව පිළිබඳ දැන්වීම, හිමිකම් රෙජිස්ටරයේ බැඳීම් අංශයේ ලියාපදිංචි කරනු ලැබිය යුතු අතර, ඒ නඩුව අවසන් වන තෙක් එසේ ලියාපදිංචි කර තිබීම පැවතිය යුතු ය.

(3) තව ද, හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ නඩුව පිළිබඳ දැන්වීම, දෙවන පංතියේ අයිතිය පිළිබඳ හිමිකම එලෙස ලියාපදිංචි කරනු ලැබූ තැනැත්තා වෙත ද, හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා වෙත හා මිනුම්පතිවරයා වෙත ද, කරනු ලැබිය යුතු ය.

*දිසා අධිකරණය විසින් රෙජිස්ටරය සංශෝධනය කරන ලෙස ආඥා කිරීම.*

**30.** (1) දිසා අධිකරණය විසින් නිසි පරීක්ෂණයකින් පසුව, ඒ කාරණයේ යුක්තිය ඉටු කිරීම පිණිස අවශ්‍ය වන පරිදි ආඥාවක් කරනු ලැබිය යුතු ය.

(2) (අ) අයිතිය පිළිබඳ දෙවන පංතියේ හිමිකමක් සහිතව ලියාපදිංචි කිරීමක් ඇති ඉඩම් කොටසක් සම්බන්ධයෙන් හිමිකම් රෙජිස්ටරය සංශෝධනය කරන ලෙස දිසා අධිකරණය විසින් ආඥා කරනු ලැබූ අවස්ථාවක, ඒ ආඥාව, හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා වෙත දැනුම් දිය යුතු අතර, ඔහු විසින් රෙජිස්ටරයේ ඒ සංශෝධනය කිරීමට සැලැස්විය යුතු ය.

(ආ) අධිකරණයේ ඒ ආඥාව, හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා වෙත සහ මිනුම්පතිවරයා වෙත ද දැනුම් දෙනු ලැබිය යුතු ය.

*හිමිකම පරම අයිතිය පිළිබඳ ප්‍රථම පංතියේ හිමිකමට පරිවර්තනය කිරීම.*

**31.** (1) අයිතිය පිළිබඳ දෙවන පංතියේ හිමිකමක් සහිතව ලියාපදිංචි වී ඇති තැනැත්තකුට හෝ ඔහුගේ මාර්ගයෙන් හිමිකමට හිමිකම් පා සිටින තැනැත්තකුට, ඒ ලියාපදිංචි කිරීමෙන් අවුරුදු දහයක කාලයක් අවසානයේ දී, ඒ ලියාපදිංචි කිරීමට විරුද්ධව ඒ අන්තර් කාලය තුළදී 29 වන වගන්තිය යටතේ කිසිම නඩුවක් නොමැති නම්, ඔහුගේ ඒ ලියාපදිංචි කිරීම පරම අයිතිය පිළිබඳ පළමුවන පංතියේ හිමිකමකට පරිවර්තනය කර ගැනීම සඳහා සුදුසුකම් ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ කාලසීමාව අවසානයේ දී ඒ තැනැත්තාට පරම අයිතිය පිළිබඳ ප්‍රථම පංතියේ හිමිකමක් සහිතව ලියාපදිංචි කරවා ගැනීමට සුදුසුකම් ඇති බවට සහතික කරමින් මේ පනතේ විධිවිධාන ප්‍රකාරව හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා විසින් හිමිකම් පිළිබඳ උපලේඛනයක් පිළියෙල කොට, ඒ හිමිකම් පිළිබඳ උපලේඛනය උචිත හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා වෙත සහ මිනුම්පතිවරයා වෙත යවනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වූ හිමිකම් පිළිබඳ උපලේඛනයක් ලැබුණු විට, හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ හිමිකම් පිළිබඳ උපලේඛනයෙහි සඳහන් ඉඩමට පරම අයිතිය පිළිබඳ ප්‍රථම පංතියේ හිමිකමක් සහිතව ඒ තැනැත්තා ලියාපදිංචි කරනු ලැබීමට සැලැස්විය යුතු ය. තවද, ඒ අනුව හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා වෙත සහ මිනුම්පතිවරයා වෙත දැනුම් දීම කළ යුතු ය.

ලියාපදිංචි කිරීමේ බලපෑම.

**32.** (1) ඉඩම් කොටසකට පරම අයිතිය පිළිබඳ ප්‍රථම පංත්යේ හිමිකමක් සහිතව, තැනැත්තකු ලියාපදිංචි කිරීමෙන්, හිමිකම් රෙජිස්ටරයේ බැඳීම් අංශයේ ලියාපදිංචි කර ඇති යම් පවත්නා සම්බන්ධතාවලට යටත්ව, ඒ ඉඩම් කොටසට අයත් හෝ අනුබද්ධිත සියලු අයිතිවාසිකම් හා වරප්‍රසාද සමග ඉඩම් කොටසේ පරම අයිතිය ඒ තැනැත්තා සතු විය යුතු ය.

(2) ඉඩම් කොටසේ අයිතිය හෝ සම්බන්ධතාවක් ඇත්තා වූ හෝ ඒ ඉඩම් කොටස මත හෝ විෂයයෙහි සම්බන්ධතාවක් හෝ භාරයක් හෝ බැඳීමක් ඇත්තා වූ තැනැත්තකු වශයෙන් නැතහොත් කළමනාකරුවකු හෝ අර්ථලාභියකු වශයෙන් මේ පනතේ විධිවිධාන යටතේ තැනැත්තකු ලියාපදිංචි කිරීමෙන්, ඒ ඉඩම් කොටසට අයත් හෝ අනුබද්ධිත, ප්‍රකාශිත හෝ ව්‍යංග වූ සියලු අයිතිවාසිකම් හා වරප්‍රසාද සමග සහ ඊට අදාළ වූ යම් ප්‍රකාශිත ගිවිසුම්වලට යටත්ව, එසේ ලියාපදිංචි කරන ලද අයිතිවාසිකම් ඒ තැනැත්තා සතු විය යුතු ය.

හිමිකම් රෙජිස්ටරයේ දැක්වෙන සටහන්, එහි පැවරීඇති අයිතිවාසිකම් පිළිබඳ අවසානාත්මක සාක්ෂි විය යුතු බව.

**33.** (1) මේ පනතේ විධිවිධාන යටතේ පවත්වා ගෙන යනු ලබන හිමිකම් රෙජිස්ටරයේ දැක්වෙන සටහන්, ඒ සටහන්වල සඳහන් අයිතිය හෝ සම්බන්ධතා පවත්නා බවට අවසානාත්මක සාක්ෂියක් විය යුතු අතර, මේ පනතින් විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, ඒ පිළිබඳව කිසිදු අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(2) හිමිකම් රෙජිස්ටරයේ නම දැක්වෙන තැනැත්තකුගේ සම්බන්ධතාවලට විරුද්ධ විය හැක්කේ මේ පනතින් විධිවිධාන සලස්වා ඇති පරිදි පමණක් වන අතර, හිමිකම් රෙජිස්ටරයේ දක්නට ලැබෙන සම්බන්ධතා හා හිමිකම්පෑම් නොවන සියලු සම්බන්ධතා හා හිමිකම්පෑම් වලින් නිදහස්ව ඊට අයත් හෝ අනුබද්ධිත සියලු අයිතිවාසිකම් හා වරප්‍රසාද සමග ඒ තැනැත්තා විසින් ඒ සම්බන්ධතා දරනු ලැබිය යුතු ය.

රෙජිස්ටරය පරීක්ෂා කිරීම හා සහතික පිටපත් නිකුත් කිරීම

රෙජිස්ටරය හා කැඩැස්තර සිතියම පරීක්ෂා කිරීම.

**34.** (1) යම් තැනැත්තකු විසින් නියමිත ආකෘතියෙහි කරන ලද ඉල්ලීමක් මත හා නියමිත ගාස්තු ගෙවීමෙන් මේ පනතේ විධිවිධාන යටතේ පවත්වාගෙන යනු ලබන යම් හිමිකම් රෙජිස්ටරයක් හෝ කැඩැස්තර සිතියමක් කාර්යාල වේලාව තුළ දී යම් තැනැත්තකු විසින් පරීක්ෂා කළ හැකි ය.

(2) යම් තැනැත්තකුට අදාළ හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා වෙත කරනු ලබන ඉල්ලීමක් මත සහ නියමිත ගාස්තුව ගෙවීමෙන්, ඒ හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා විසින් සහතික කරන ලද ඒ හිමිකම් රෙජිස්ටරයේ උධෘතයක් ලබා ගැනීමට හිමිකම් තිබිය යුතු ය.

(3) යම් තැනැත්තකුට, අදාළ මිනුම් අධිකාරීවරයා වෙත කරනු ලබන ඉල්ලීමක් මත හා නියමිත ගාස්තුව ගෙවීමෙන් මිනුම්පතිවරයා වෙනුවෙන් සහතික කළ හිමිකම් ලියාපදිංචි කිරීම සඳහා භාවිත කරන ලද යම් කැඩැස්තර සිතියමක උධෘතයක් ලබාගැනීමට හිමිකම් තිබිය යුතු ය.

රෙජිස්ට්‍රාර්වරයා විසින් සහතික කිරීම බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු බව.

**35.** (1) හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයකු විසින් සහතික කරන ලදැයි කියනු ලබන සෑම ලේඛනයක් ම, සියලු නඩු කටයුතුවල දී එසේ සහතික කරනු ලැබ ඇත්තේ යයි පූර්ව නිගමනය කරනු ලැබිය යුතු අතර, ඒ කාරණය පිළිබඳව යම් වැඩිදුර ඔප්පු කිරීමක් නොමැතිව, එය අදාළ වන කාරණය සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් වශයෙන් පිළිගනු ලැබිය යුතු ය.

(2) මිනුම්පතිවරයා විසින් හෝ වෙනුවෙන් සහතික කරන ලදැයි කියනු ලබන කැඩැස්තර සිතියමක සෑම පිටපතක් ම, සියලු නඩු කටයුතුවල දී එසේ සහතික කර ඇතැයි පූර්ව නිගමනය කරනු ලැබිය යුතු අතර, එය අදාළ වන කාරණය සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් වශයෙන් පිළිගනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ විධිවිධානවලට යටත්ව යම් රෙජිස්ටරයක කර ඇති සෑම ඇතුළත් කිරීමක් ම හෝ සටහනක් ම සහ හිමිකමක් ලියාපදිංචි කිරීම සඳහා ප්‍රයෝජනයට ගනු ලැබූ කැඩැස්තර සිතියමක් ම, සියලු නඩු කටයුතුවල දී එය වාර්තාගත කර ඇති කාරණය හෝ ගනුදෙනුව පිළිබඳ තීරණාත්මක සාක්ෂියක් වශයෙන් භාර ගනු ලැබිය යුතු ය.

**අතුරු බෙදීම් හා ඒකාබද්ධ කිරීම්**

ඒකක අතුරු බෙදීම හා ඒකාබද්ධ කිරීම.

**36.** (1) යම් ඉඩම් කොටසකට හෝ ඉඩම් කොටස්වලට ඇති ස්වකීය හිමිකම් මේ පනත යටතේ ලියාපදිංචි කර ඇති යම් අයිතිකරුවකු හෝ අයිතිකරුවන් විසින් මේ පනතේ විධිවිධානවලට අනුකූලව ඒ ඉඩම් කොටසකට අදාළ වූ නැවත බෙදීමේ හෝ ඒකාබද්ධ කිරීමේ හෝ අතුරු බෙදීමේ සැලැස්මක් ලියාපදිංචි කිරීමෙන් ඔහුගේ හෝ ඔවුන්ගේ ඉඩම් කොටස ඒකාබද්ධ කිරීම හෝ අතුරු බෙදීම කළ හැකි ය.

(2) ඒකාබද්ධ කිරීම හෝ අතුරු බෙදීම සඳහා වූ ඉල්ලීමක්, අදාළ මිනුම් අධිකාරිවරයා වෙත පිටපතක් සහිතව හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ඒ ඉල්ලීමෙහි ඉල්ලුම්කරු විසින් කරනු ලබන නියමිත ආකෘතියෙහි වූ ප්‍රකාශයක් ඇතුළත් විය යුතු ය. තව ද, ඒ ඉල්ලීමෙහි –

(අ) ඉඩම් කොටසට හෝ ඉඩම් කොටස්වලට බලපාන සෑම බැඳීමක්, විනිශ්චයට භාජනයව තිබීමක්, තහනමට ගැනීමක්, ආඥාවක් හෝ තීන්දු ප්‍රකාශයක් ඇත්නම්, ඒ පිළිබඳ විස්තර ;

(ආ) හිමිකම් රෙජිස්ටරයට යොමු කිරීමක් සහ ඒ ඉඩම් කොටස හෝ ඉඩම් කොටස් සම්බන්ධයෙන් ලියාපදිංචි කර ඇති කැඩැස්තර සිතියමට යොමු කිරීමක් ;

(ඇ) මැනීම් කටයුතු පවත්වා ගෙන යාම පාලනය වන යම් නියෝගයකට අනුකූලව යථාපරිදි බලය දෙනු ලැබූ මිනින්දෝරුවරයකු විසින් සකස් කරන ලද මිනුම් පිඹුරක් සහ ඒ ඉඩම් කොටස හෝ ඉඩම් කොටස් ඒකාබද්ධ කිරීම හෝ අතුරු බෙදීම පෙන්නුම් කරන සහ ඒ ප්‍රදේශය දක්වන කැඩැස්තර සිතියමට යොමු කිරීමක්

දරන කැඩැස්තර සිතියම පිළියෙල කිරීම ඇතුළත් විය යුතුය.

(3) සැලැස්ම, කැඩැස්තර සිතියමට සහ ඒ මිනුම් හා කැඩැස්තර සිතියම පාලනය වන්නා වූ යම් නියෝගවලට අනුකූල වන බවට මිනුම් අධිකාරිවරයා සෑහීමට පත්වන අවස්ථාවක ඒ සැලැස්ම ඉදිරිපත් කළ තැනැත්තාට ඔහු විසින් ඒ අනුව දැනුම් දීමක් කළ යුතු ය. තවද, ඔහු විසින් මිනුම්පතිවරයා වෙනුවෙන් ඒ සැලැස්ම අනුමත කළ යුතු අතර ඒ අතුරු බෙදීම හෝ ඒකාබද්ධ කිරීම කැඩැස්තර සිතියමේ පෙන්වමින් අවශ්‍ය සංශෝධන කිරීමට සලස්වා ඒ සංශෝධන පෙන්නුම් කෙරෙන කැඩැස්තර සිතියමේ කොටසේ පිටපතක් ඒ ඉඩම පිහිටි දිස්ත්‍රික්කයේ හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(4) ඉදිරිපත් කරන ලද සැලැස්මේ මුල් පිටපත, ක්ෂේත්‍ර සටහන් හා ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලීම්, මිනුම් අධිකාරිවරයාගේ කාර්යාලයේ ගොනු කර තැබිය යුතු ය.

(5) (අ) ඒකාබද්ධ කිරීම හෝ අතුරු බෙදීම සඳහා මිනුම් අධිකාරිවරයාගෙන් සහතික කළ කැඩැස්තර සිතියමේ කොටස ලැබුණු විට, හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා විසින්, ඒකාබද්ධ කිරීම හෝ අතුරු බෙදීම සඳහා වූ ඒ ඉල්ලීම, මේ පනතේ විධිවිධානවලට හා ඒ යටතේ සාදන ලද නියෝගවලට අනුකූල බවට ඔහු සෑහීමට පත්වන්නේ නම්, ඒ ඉඩම් කොටසට හෝ ඉඩම් කොටස්වලට අදාළ, කලින් හිමිකම් ලේඛනවලට නිවැරදි හරස් යොමුකිරීම් සහිතව, එසේ ඒකාබද්ධ කරන ලද හෝ අතුරු බෙදා වෙන්කරන ලද ඉඩම් කොටස හෝ ඉඩම් කොටස් හිමිකම් රෙජිස්ටරයේ ලියාපදිංචි කළ යුතු ය :

(ආ) ලැබුණු ඉල්ලීම හා ලේඛන, හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා විසින් අදාළ පාර්සල් ලිපිගොනුවේ ගොනු කරනු ලැබිය යුතු ය.

(6) ඒකාබද්ධ කිරීමේ හෝ අතුරු බෙදීමේ සැලැස්මක් ලියාපදිංචි කිරීමෙන් පසු–

(අ) එහි නිරූපණය කර ඇති ඉඩම් කොටස හෝ ඉඩම් කොටස එහි විස්තර කර ඇති පරිදි ඒකාබද්ධ කර ඇති ලෙස හෝ අතුරු බෙදා ඇති ලෙස සලකනු ලැබිය යුතු ය :

(ආ) ඒ ඉඩම් කොටසට හෝ ඉඩම් කොටස්වලට අදාළ මුල් කැඩැස්තර සිතියමේ ඒ ඉඩමට හෝ ඉඩම්වලට බලපාන පරවශතා කිසිවක් ඒකාබද්ධ කිරීමේ හෝ අතුරු බෙදීමේ සැලැස්මේ ඇතුළත් කර ඇති සේ ඒ ඉඩම් කොටස හෝ ඉඩම් කොටස් ඒ පරවශතාවල භාරයට යටත් විය යුතු අතර, එහි ප්‍රතිලාභ ඒ ඉඩමට හෝ ඉඩම්වලට තිබිය යුතු ය.

**37.** (1) මේ පනත යටතේ ලියාපදිංචි කරන ලද ඉඩම් කොටසකට අයිතිය පිළිබඳ හිමිකමක් හෝ වෙනත් සම්බන්ධතාවක් ඇත්තා වූ යම් තැනැත්තකු විසින්, නියමිත ගාස්තුව ගෙවීමෙන් පසු ඒ අයිතිය හෝ සම්බන්ධතාව සම්බන්ධයෙන් උචිත හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයාගෙන් හිමිකම් සහතිකයක් ලබා ගත හැකි ය. හිමිකම් සහතික.

(2) මේ පනතේ විධිවිධානවලට යටත්ව, ඒ හිමිකම් සහතිකය ඒ සම්බන්ධතාවට ඇති හිමිකම් පිළිබඳ අවසානාත්මක සාක්ෂිය විය යුතු ය.

## ලියාපදිංචි කරන ලද ඉඩමකට අදාළ ගනුදෙනු

ලියාපදිංචි කරන ලද නම් මිස ඉඩමකට සම්බන්ධතාව අත්කර ගෙන නොමැති බව.

**38.** මේ පනතේ විධිවිධාන යටතේ ලියාපදිංචි කරන ලද යම් ඉඩම් කොටසක හිමිකමක් හෝ යම් සම්බන්ධතාවක් අත්කර ගන්නා කිසිදු තැනැත්තකුට, ඒ හිමිකම හෝ සම්බන්ධතාව මේ පනතේ විධිවිධාන යටතේ ලියාපදිංචි කරන ලදදේ නම් මිස, ඒ හිමිකමට හෝ සම්බන්ධතාවට හිමිකම නොලැබිය යුතු ය.

ඉඩම්වලට අදාළ ගනුදෙනු මේ පනතට අනුකූලව සිදුකළ යුතු බව.

**39.** මේ පනත යටතේ හිමිකම ලියාපදිංචි කර ඇති කිසිදු ඉඩම් කොටසක් හෝ එහිලා වූ යම් සම්බන්ධතාවක්, මේ පනතේ විධිවිධානවලට අනුකූලව හැර, පැවරීම හෝ ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම නොකළ යුතු අතර, අන්‍යාකාරව සිදුකරනු ලබන සෑම බැහැර කිරීමක් ම ශූන්‍ය විය යුතු ය.

ලියාපදිංචි කිරීම සඳහා සාධන පත්‍රයක් ඉදිරිපත් කළ හැක්කේ කාටද යන වග.

**40.** (1) මේ පනත යටතේ ඉඩම් කොටසක සම්බන්ධතාව පැවරීම සඳහා වූ සාධන පත්‍රයක්, හිමිකම් ලියාපදිංචි කිරීම සඳහා හිමිකම් රෙජිස්ට්‍රාර්වරයා වෙත–

(අ) ඒ යටතේ යම් සම්බන්ධතාවක් හෝ ප්‍රතිලාභයක් ඉල්ලා සිටින යම් තැනැත්තකු විසින් ;

(ආ) එයින් බලපෑ යම් දේපළක් කෙරෙහි යම් සම්බන්ධතාවක් ඇති හෝ ඒ මත අයහාරයක් ඇති යම් තැනැත්තකු විසින් ; හෝ

(ඇ) ඒ සාධන පත්‍රය ලියා සහතික කරන යම් තැනැත්තකු විසින් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) ලියාපදිංචි කිරීම සඳහා සාධන පත්‍රයක පිට ගෙවිය යුතු ගාස්තු කිසිවක් වේ නම්, ඒ ගාස්තු ද සමග තැපැල් මගින් හෝ ආවරණයක් යටතේ හෝ ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

දෛනික පොත.

**41.** (1) ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන සෑම සාධන පත්‍රයක ම නියමිත පිටපත් ද සමග ඒ සාධන පත්‍රය ඉදිරිපත් කරන ලද දිනය හා පැය වේලාව ද, ඒ සාධන පත්‍රය ඉදිරිපත් කරන තැනැත්තා විසින් ඉල්ලා සිටිනු ලබන්නේ නම්, ඒ ඉදිරිපත් කිරීමේ මිනිත්තු වේලාව ද ඇතුළත් කරනු ලැබිය යුතු "දෛනික පොත" යයි කියනු ලබන පොතක්, එක් එක් හිමිකම් රෙජිස්ට්‍රාර්වරයා විසින් තබා ගනු ලැබිය යුතු අතර, ප්‍රමුඛත්වය පිළිබඳ කාර්යය සඳහා ඉදිරිපත් කිරීමට යෙදුනු වේලාව, ලියාපදිංචි කිරීමේ වේලාව ලෙස ගණන් ගනු ලැබිය යුතු ය.

(2) තැපැල් මගින් හෝ ආවරණයක් යටතේ හෝ ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරන ලද ඉල්ලීමක්, ඒ ඉල්ලීම අඩංගු පැකැට්ටුව විවෘත කිරීමට යෙදුනු වේලාවේ දී එය ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරනු ලැබූ සේ සැලකිය යුතු ය.

**පූර්වතා හා හිමිකම.**

42. රෙජිස්ටරයේ පෙන්නුම් කෙරෙන ඉඩම් කොටසකට ඇති හිමිකම් හෝ ඉඩම් කොටසට අදාළ යම් සම්බන්ධතාවක් ඒ හිමිකමට හෝ සම්බන්ධතාවට අදාළ සාධන පත්‍රවල දින සහ රෙජිස්ටරයේ ඇතුළත් කරන ලද දිනය ගැන නොතකා, ඒ සාධන පත්‍ර ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරනු ලැබූ අනුපිළිවෙල අනුව ඒ සාධන පත්‍ර ලියාපදිංචි කිරීමෙහි ලා පූර්වතාව ලැබිය යුතු ය.

**ඉඩම් කොටස් වලට අදාළ සාධන පත්‍රවල ආකෘතිය.**

43. (1) මේ පනත යටතේ ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරන ලද ඉඩම් කොටසක හිමිකම හෝ යම් සම්බන්ධතාවක් සමර්පණය කරන සෑම සාධන පත්‍රයක්ම තත් කාර්ය සඳහා නියමිත ආකෘති පත්‍රයෙහි විය යුතු ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ සකස් කරන ලද සාධන පත්‍ර ගනුදෙනුවේ පාර්ශ්වකරුවන් ද සාක්ෂිකරුවන් දෙදෙනකු විසින් අත්සන් කරනු ලැබ, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු විසින් සහ, රජයේ ඉඩමක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී ප්‍රසිද්ධ නොතාරිස්වරයකු විසින් හෝ යම් නීතියකින් හෝ ඒ යටතේ බලය දෙන ලද රජයේ නිලධරයකු විසින් ලියා සහතික කරනු ලැබිය යුතු ය.

**ලියා සහතික කරන්නාගේ කාර්ය.**

44. මේ පනත ප්‍රකාර සාධන පත්‍රයක් ලියා සහතික කරන ප්‍රසිද්ධ නොතාරිස්වරයකු විසින් –

(අ) තමන් නොදන්නා ගනුදෙනුවට පාර්ශ්වකරුවන් සහ සාක්ෂිකරුවන් කවරකුගේ හෝ අනන්‍යතාව පිළිබඳව ඔහුගේ නිල හැඳුනුම්පත් හෝ ඔවුන්ගේ අනන්‍යතාව විශ්වාසදායක ලෙස හෙළි කරන වෙනත් යම් මාර්ගයක් අනුව විමසා බැලීමෙන් තමා සෑහීමට පත් විය යුතු ය.

(ආ) ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ඇති ලේඛන විමසා බැලීමෙන් හෝ අදාළ හිමිකම් රෙජිස්ටරයේ උධෘතයක් විමසා බැලීමෙන් සාධන පත්‍රයට පාර්ශ්වකරුවන් වන තැනැත්තන්ගේ ශක්‍යතාව පිළිබඳව සෑහීමට පත්විය යුතු ය.

(ඇ) හිමිකම් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරන ලද සහතිකය හිමිකම් ලියපදිංචි කිරීමේ කාර්යාලයේ ඇති ලේඛන විමසා බැලීමෙන් ඉඩමේ අනන්‍යතාව සහ ඒ සාධන පත්‍රයෙහි සඳහන් හිමිකමේ තත්ත්වය පිළිබඳව, තමා සෑහීමට පත් විය යුතු ය.

ලියා සහතික කළ සාධන පත්‍ර ලියා සහතික කරන්නා විසින් දින හතක් ඇතුළත ඉදිරිපත් කළ යුතු බව.

45. (1) (අ) 44 වන වගන්තිය ප්‍රකාර ලියා සහතික කරන ලද යම් සාධන පත්‍රයක්, විකුණුම්කරුගේ හිමිකමට අදාළ හිමිකම් සහතික ද සමග, ලියා සහතික කරන්නා විසින්, එසේ සහතික කිරීමෙන් වැඩ කරන දින හතක් ඇතුළත, ඒ සාධන පත්‍රයෙහි සඳහන් ඉඩම් කොටස පිහිටියේ හිමිකම් පිළිබඳ යම් රෙජිස්ට්‍රාර්වරයකුගේ බලප්‍රදේශය ඇතුළත ද, ඒ බලප්‍රදේශයේ හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිපත් කළ යුතු ය.

(ආ) ලියා සහතික කරන ලද සාධන පත්‍රය, නියමිත කාලය ඇතුළත ඉදිරිපත් කිරීම පැහැර හැරීම නියම කරනු ලැබ ඇති දණ්ඩනයෙන් දඬුවම් ලැබිය යුතු වරදක් විය යුතු ය.

(2) හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා විසින් මේ පනතේ විධිවිධාන යටතේ ඔහු විසින් පවත්වාගෙන යනු ලබන පොත් පත්වල ඒ සාධන පත්‍රය ලැබුණු බවට ලේඛනගත කළ යුතු අතර, පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන්, එනම්-

(අ) සාධන පත්‍රය මේ පනතේ විධිවිධානවලට අනුකූලව සකස් කර ඇති බවට :

(ආ) ඉඩම් කොටස හඳුනාගෙන ඇති බවට හා නිවැරදිව විස්තර කර ඇති බවට සහ හිමිකම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ රෙජිස්ටරවල ඇති ඒ ඉඩම් කොටසේ විස්තරයට අනුකූල වන බවට ;

(ඇ) ඒ හිමිකම හෝ සම්බන්ධතාව සමර්පණය කරන තැනැත්තාට හිමිකම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ රෙජිස්ටරවල තිබෙන තොරතුරුවලට අනුව, ඒ සාධන පත්‍රය ලියා අත්සන් කිරීමට ශක්තතාවක් තිබුණු බවට ;

(ඈ) සමර්පණය කරන ලද හෝ ක්‍රියා කරන ලද හිමිකම හෝ සම්බන්ධතාව, අර්ථ ව්‍යාකූල බවකින් තොරව හඳුනාගෙන ඇති බවට හා හිමිකම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ රෙජිස්ටරවල ලේඛනගත කර ඇති හිමිකමට හෝ සම්බන්ධතාවට අනුකූල වන බවට

තමා සෑහීමට පත් විය යුතු ය.

(3) ලියපදිංචි කිරීම සඳහා මේ පනත යටතේ වූ සියලු නියම ඉටු කර ඇති බවට හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයාගේ මතය වන්නේ නම්, ඔහු විසින්, නියමිත ආකාරයට ඒ හිමිකම හෝ සම්බන්ධතාව ලියාපදිංචි කොට, ඒ හිමිකම හෝ සම්බන්ධතාවක් ඇති කරන්නා වූ හෝ පවරන්නා වූ සාධන පත්‍රය ද, විකුණුම්කරු විසින් ඉදිපත් කරන ලද හිමිකම් සහතිකය ද, අදාළ පාර්සල් ලිපිගොනුවෙහි ගොනුකර, සාධන පත්‍රය ඉදිරිපත් කළ තැනැත්තාට හිමිකම් සහතිකයක් නිකුත් කළ යුතු ය :

එසේ වුව ද, ඒ සාධන පත්‍රය බද්දක් හෝ උකසක් සම්බන්ධයෙන් වන අවස්ථාවක, ඒ බද්දට හෝ උකසට යොමු කිරීමක් කරන හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා විසින් පරණ හිමිකම් සහතිකය මත කරන ලද පිටසන් කිරීමක් සමග ඒ පරණ හිමිකම් සහතිකය ද, ඒ තැනැත්තා වෙත ආපසු භාරදෙනු ලැබිය යුතු ය. හිමිකම් රෙජිස්ට්‍රාර්වරයා විසින්, ලියාපදිංචි කිරීම සම්පූර්ණ කළ ඉක්බිතිව ම, අලුත් සටහන් ක්‍රම සියල්ලම මිනුම්පතිවරයා වෙත දැනුම් දිය යුතු ය.

**හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා විසින් අනාගතයේ දී හිමිකම සමර්පණය කරන සාධන පත්‍රයක් ලියාපදිංචි නොකළ යුතු බව.**

**46.** යම් අනාගත කාලයක දී යම් සිද්ධියක් සිදුවීම මත හෝ යම් කොන්දේසියක් ඉටු කිරීම මත, ඉඩම් කොටසක් පිළිබඳ යම් හිමිකමක් හෝ සම්බන්ධතාවක් සමර්පණය කරනු ලබන්නේ යයි කියනු ලබන යම් සාධන පත්‍රයක්, හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියාපදිංචි කරනු නොලැබිය යුතු ය :

එසේ වුවද, ජීවිත භුක්තියකට යටත්ව, කරනු ලබන හිමිකම් පිළිබඳ සමර්පණයක්, ලියාපදිංචි කිරීම සඳහා පිළිගනු ලැබිය යුතු ය.

අලුත් රෙජිස්ටර විවෘත කළහොත් මිස ඉඩම් කොටසක පැවරීම නොකළ යුතු බව.

**47.** මේ පනතේ විධිවිධාන යටතේ පරම අයිතිය පිළිබඳ ප්‍රථම පන්තියේ හිමිකමක් හෝ අයිතිය පිළිබඳ දෙවන පන්තියේ හිමිකමක් සහිතව ලියාපදිංචි කර ඇති ඉඩමක කිසිම කොටසක්, ලියාපදිංචි කළ අයිතිකරු විසින් ඒ ඉඩම් කොටස පළමුවෙන් අතුරු බෙදා වෙන්කර ඇත්නම් සහ මේ පනතේ විධිවිධාන යටතේ, එසේ අතුරු බෙදීම සිදු කළ ඉඩම් කොටස ලියාපදිංචි කර ඇත් නම් මිස, පැවරීම හෝ ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීම හෝ නොකළ යුතු ය.

සම අයිතිය පවරන්නා වූ සාධන පත්‍රය අවලංගු බව.

**48.** මේ පනතේ විධිවිධානවලට අනුකූලව හැර, මේ පනත යටතේ ලියාපදිංචි කර ඇති ඉඩම් කොටසක අයිතියට අදාළ පොදුවේ තැනැත්තන් දෙදෙනකුගේ හෝ ඊට වැඩි ගණනකගේ නමින් සාදන ලද සාධන පත්‍රයක් ශූන්‍ය විය යුතු අතර, එය මේ පනත යටතේ ලියාපදිංචි කරනු නොලැබිය යුතු ය.

ලියාපදිංචි කරනු ලැබීමේ දී සාධන පත්‍රය බලාත්මක විය යුතු බව.

**49.** මේ පනතේ විධිවිධාන යටතේ ලියා අත්සන් කරන ලද ඉඩම් කොටසකට අදාළ සාධන පත්‍රයක්, මේ පනතේ විධිවිධාන යටතේ ඒ සාධන පත්‍රය ලියාපදිංචි කරනු ලැබීමේ දී බලාත්මක විය යුතු ය.

## ස්ථිර හිමිකම්

ගොඩනැගිලිවල තිරස් අතුරු බෙදීම් ලියාපදිංචි කිරීම.

**50.** (1) මේ පනතේ සහ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිකම් පනතේ විධිවිධානවලට යටත්ව, එක් මහලකට වඩා වැඩි මහල් ගණනකින් යුත් ගොඩනැගිල්ලක් ඉදිකර ඇති මේ පනත යටතේ ලියාපදිංචි කර ඇති යම් ඉඩම් කොටසක අයිතිකරු විසින්, නියමිත ගාස්තුව ගෙවීමෙන් (මෙහි මින් මතු "සහාධිපත්‍ය කොටස්" යනුවෙන් සඳහන් කරනු ලබන) ගොඩනැගිලිවල තිරස් අතුරු බෙදීම, ඉල්ලුම්පත්‍රය සමග තිබිය යුතු සහාධිපත්‍ය පිඹුරක් යනුවෙන් හඳුන්වනු ලබන කැඩැස්තර සිතියමක් අනුව, ලියාපදිංචි කිරීම සඳහා නියමිත ආකෘතියේ වූ ඉල්ලුම් පත්‍රයක්, හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) ගොඩනැගිල්ල ඉදිකර ඇති ඉඩම් කොටසේ යොමු අංකය ද, කැඩැස්තර සිතියමේ දක්වා ඇති පරිදි සහාධිපත්‍ය කොටසේ අංකය ද, එකට ගත් විට, එය සහාධිපත්‍ය කොටසට ප්‍රමාණවත් යොමු කිරීමක් විය යුතු ය.

(3) සහාධිපත්‍ය සැලැස්ම සහ කැඩැස්තර සිතියම ද සමග, සහතික කිරීම සඳහා, හිමිකම් රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ ඉල්ලීම මිනුම් අධිකාරිවරයා වෙත යොමු කළ යුතු ය.

මිනුම් අධිකාරිවරයා විසින් සහාධිපත්‍ය පිඹුර ගොනු කිරීම.

51. සහාධිපත්‍ය පිඹුරු, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිකම් පනතේ සහ මේ පනතේ විධිවිධානවලට අනුකූල වන බවට මිනුම් අධිකාරිවරයා සෑහීමට පත් වූ විට, ඔහු විසින් ඒ පිඹුර මිනුම්පතිවරයා වෙනුවෙන් සහතික කළ යුතු අතර—

(අ) හිමිකම ලියාපදිංචි කිරීම සඳහා භාවිත කරන ලද කැඩැස්තර සිතියමෙහි සුදුසු යොමු කිරීමක් කිරීමෙන් පසුව, සහාධිපත්‍ය පිඹුරේ මුල් පිටපත ගොනු කළ යුතු ය; තවද

(ආ) සහාධිපත්‍ය පිඹුරේ අනුපිටපත සහ අයිතිකරුගේ ඉල්ලුම් පත්‍රය උචිත හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

සහාධිපත්‍ය කොටස් ලියාපදිංචි කරනු ලබන අන්දම.

52. ඉල්ලුම්පත්‍රය ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිකම් පනතේ සහ මේ පනතේ විධිවිධානවලට අනුකූල වන බවට හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා සෑහීමකට පත්වන්නේ නම්, ඔහු විසින්-

(අ) සහාධිපත්‍ය පිඹුරේ අනු පිටපත ඉඩම් කොටස් පිළිබඳ ලිපිගොනුවේ ගොනු කරනු ලැබිය යුතු ය;

(ආ) සහාධිපත්‍ය පිඹුරේ දක්වා ඇති එක් එක් සහාධිපත්‍ය කොටස් සම්බන්ධයෙන් අලුත් රෙජිස්ටරයක් විවෘත කර, ඒ රෙජිස්ටරය ඉඩම් කොටස ලියාපදිංචි කර ඇති රෙජිස්ටරයේ සුදුසු අතුරු යොමු කිරීම් කළ යුතු ය;

(ඇ) ඉඩම් කොටසට අදාළ රෙජිස්ටරයේ ඉඩම් පිළිබඳ කොටසේ, එහි අඩංගු ඉඩම, පොදු දේපළකින් පමණක් සමන්විත වන බව, වාර්තා කළ යුතු ය;

(ඈ) බැඳීම් පිළිබඳ කොටසේ සහාධිපත්‍ය කොටස් සම්බන්ධයෙන් රෙජිස්ටර විවෘත කර ඇති බව, වාර්තා කළ යුතු ය;

(ඉ) ඒ සභාධිපත්‍ය කොටස ලියාපදිංචි කර ඇති බවද, අදාළ රෙජිස්ටරවල යොමු අංක ද, ඉල්ලුම්කරුට දැනුම් දිය යුතු ය;

(ඊ) නියමිත ගාස්තු අයකර ගැනීමෙන් පසුව හිමිකම් සහතිකයක් නිකුත් කළ යුතු ය.

### සාධන පත්‍ර රඳවා ගැනීම

සාධන පත්‍ර රඳවා ගැනීම හා විනාශ කිරීම.

53. (1) හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා විසින් කර ගන්නා ලද යම් සාධන පත්‍රයක්, එය රෙජිස්ටරයේ එවකට පවතින සටහනක් තහවුරු කරන තාක් කල් හා ඉන් පසුව අවුරුදු දහයක් ඉකුත් වන තෙක් හිමිකම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙහි රඳවා ගනු ලැබිය යුතු ය.

(2) ඉඩම් කොටසක හිමිකමකට හෝ සම්බන්ධතාවකට අදාළ රෙජිස්ටරයේ සටහනක් අභිභවනය වී ඇති හෝ, බලාත්මකව පැවතීම අවසාන වී ඇති අවස්ථාවක හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ සටහනට කෙලින්, රෙජිස්ටරයේ ඒ බවට වූ සටහනක් කළ යුතු ය.

(3) අන්තිම කැමති පත්‍රයක් රහිත අනුප්‍රාප්තික අවස්ථාවල දී රෙජිස්ටරයේ සටහනක් අභිභවනය වීමෙන් හෝ බලාත්මකව පැවතීම අවසාන වීමෙන් පසුව අවුරුදු දහයක් ඉකුත් වූ විට, ඒ සටහන තහවුරු කළ යම් සාධන පත්‍රයක් හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා විසින් නියමිත ආකාරයෙන් විනාශ කර රෙජිස්ටරයෙහි ඒ බවට සටහනක් කළ යුතු ය.

### හිමිකම් ප්‍රේෂණය කිරීම

අන්තිම කැමති පත්‍ර සහ ඒවායේ නියම අනුව ලියා අත්සන් කරන ලද සාධන පත්‍ර ලියාපදිංචි කිරීම.

54. (1) ලියාපදිංචි අයිතිකරුවකු, අන්තිම කැමති පත්‍රයක් තබා මියගිය අවස්ථාවක, අන්තිම කැමති පත්‍රය පිළිබඳ ප්‍රොබෙට් බල පත්‍රය ප්‍රදානය සහ අන්තිම කැමති පත්‍රය ප්‍රකාර, ලියා අත්සන් කරන ලද යම් සාධන පත්‍රයක්, මේ පනතේ විධිවිධාන අනුව ලියාපදිංචි කිරීම සඳහා හිමිකම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබිය හැකි, ඉඩම් කොටසක නියමිත අවම ප්‍රමාණයට වඩා ප්‍රමාණයෙන් කුඩා වූ, නොබෙදූ කොටසක හෝ බෙදූ කොටසක, තැනැත්තකු අයිතිකරුවකු කරන අන්තිම කැමති පත්‍රයක ඇති යම් විධිවිධානයකට නීතිමය බලපෑමක් නොතිබිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් අන්තිම කැමති පත්‍රයක විධිවිධානයක් සම්බන්ධයෙන් ඉල්ලුම්පත්‍රයක් ගොනුකර හෝ ඔප්පු කර ඇත්තේ යම් අධිකරණයක ද, ඒ අධිකරණය විසින් ඒ ඉඩම් කොටසට තරඟ කරන හිමිකම්පාන්නන් අතර, ඒ ඉඩම් කොටස විකුණන ලෙස ආඥා කරනු ලැබිය යුතු ය.

(4) 29 වන සහ 30 වන වගන්තිවල විධිවිධාන, අන්තිම කැමති පත්‍රයක් සහිත අනුප්‍රාප්තිය පිළිබඳව වූ අධිකරණ නඩු කටයුතුවල දී අදාළ විය යුතු ය.

ලියාපදිංචි අයිතිකරු අන්තිම කැමති පත්‍රයක් නොතබා මියගිය විට.

55. (1) ලියාපදිංචි අයිතිකරුවකු අන්තිම කැමති පත්‍රයක් නොතබා මියගියහොත්, සම්බන්ධතාවක් ඇති යම් පාර්ශ්වකරුවකු විසින් ඒ ලියාපදිංචි අයිතිකරුගේ මරණය පිළිබඳව, හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා වෙත දැනුම් දිය හැකි ය.

(2) එසේ දැනුම් දෙනු ලැබූ විට, හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා ඒ මියගිය තැනැත්තාගේ නමට ලියාපදිංචි කර ඇති ඉඩම් කොටස්වලට හිමිකම්පාන්නන් කැඳවමින් නියමිත ආකාරයේ වූ දැන්වීමක් පළ කළ යුතු ය.

(3) අන්තිම කැමති පත්‍රයක් රහිත අනුප්‍රාප්තික අවස්ථාවල දී හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා විසින් හිමිකම්පාන්නන් කැඳවීම කෙරෙහි මේ පනතේ 13, 14, 20, 21, 22, 23, 24, 25, 26 සහ 27 වන වගන්තිවල විධිවිධාන අදාළ විය යුතු ය.

අයිතිය ලියාපදිංචි කිරීම.

56. (1) යම් නීතියක් යටතේ කරන ලද හෝ නිකුත් කරන ලද යම් ආඥාවක් හෝ විකිණීමේ සහතිකයක් ප්‍රකාර යම් තැනැත්තකු මේ පනත යටතේ ලියාපදිංචි කරන ලද යම් ඉඩම් කොටසක අයිතිකරු වී හෝ යම් ඉඩම් කොටසක සම්බන්ධතාවක් අත්කරගෙන ඇති අවස්ථාවක, හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා විසින් ඔහුට අවශ්‍ය යම් සාක්ෂි මගින් තහවුරු කරනු ලැබ, ඒ තැනැත්තා විසින් කරනු ලබන ඉල්ලීමක් මත, ඒ තැනැත්තා ඒ ඉඩම් කොටසේ හෝ ඒ ඉඩම් කොටසේ යම් සම්බන්ධතාවක අයිතිකරු වශයෙන් ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(2) යම් අධිකරණ ආඥාවක් ප්‍රකාර අයිතිකරුවකු වශයෙන් ක්‍රියා කිරීමට යම් තැනැත්තකු හිමිකම් ලබන අවස්ථාවක, ඒ පිළිබඳව හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා සෑහීමට පත්වන පරිදි තහවුරු කරන ලියවිලි ද සමග තත් කාර්යය සඳහා ඉල්ලීමක් කරනු ලැබූ විට, හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ තැනැත්තා ඒ තත්ත්වයෙහි ලා ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

## සාමාන්‍ය විධිවිධාන

කාලාපගමන ආඥාපනත මේ පනත යටතේ ලියාපදිංචි කරන ලද ඉඩම් කොටස්වලට අදාළ නොවිය යුතු බව.

57. මේ පනත යටතේ ලියාපදිංචි කරන ලද, පරම අයිතියේ ප්‍රථම පංතියේ හිමිකමක් හෝ අයිතියේ දෙවන පංතියේ හිමිකමක් සහිත ඉඩම් කොටස්වලට හෝ ඉඩම් කොටසක සම්බන්ධතාවලට (68 වන අධිකාරය වූ) කාලාවරෝධ ආඥාපනත අදාළ නොවිය යුතු ය.

නිවැරදි කිරීම සහ හානිපූරණය කිරීම.

58. හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා විසින් පහත දැක්වෙන අවස්ථාවල දී එනම්–

(1) හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ නියමයක් මත

(අ) යම් අයිතිකරුවකුගේ සම්බන්ධතාවලට වැදගත් ආකාරයකින් බලපෑමක් නොවන වැරදි හෝ අත්හැරීම් සොයාගනු ලැබූ අවස්ථාවක:

(ආ) නැවත මැනීමක් මත මිනුම්පතිවරයා විසින් සහතික කරන ලද පරිදි, රෙජිස්ටරයේ ඇතුළත් විස්තර සංශෝධනය කිරීම අවශ්‍ය වන අවස්ථාවක, ඒ සංශෝධනය කෙරෙහි සම්බන්ධතාවක් ඇති බවට හෝ ඒ සංශෝධනයෙන් බලපෑමට ලක්වීමට ඉඩ ඇති බවට ඒ රෙජිස්ටරයෙහි පෙන්නුම් වන සියලු තැනැත්තන් වෙත දැන්වීම් කිරීමෙන් පසුව, සහ ඒ මත ලිඛිත කරුණු දැන්වීම් කැඳවීමෙන් පසුව ;

(ඇ) (110 වන අධිකාරය වූ) උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනතේ විධිවිධාන යටතේ ලියාපදිංචි අයිතිකරුගේ නම වෙනස් කර ඇති බවට සාක්ෂි ඉදිරිපත් කර ඇති විටක ;

(ඈ) ඒ රෙජිස්ටරය 59 වගන්තිය යටතේ නිවැරදි කරන ලෙස අධිකරණය විසින් කරන ලද ආඥාවක් මත

මේ පනත යටතේ පවත්වාගෙන යනු ලබන රෙජිස්ටරය සහ වෙනත් වාර්තා නිවැරදි කරනු ලැබිය හැකි ය.

අධිකරණය විසින් නිවැරදි කරන ලෙස ආඥා කරනු ලබන අවස්ථා.

59. 60 වන වගන්තියට යටත්ව, යම් ලියාපදිංචි කිරීමක් වංචාවෙන් ලබා ගෙන ඇති බවට අධිකරණයක් සෑහීමට පත්වන අවස්ථාවක, රෙජිස්ටරය නිවැරදි කරන ලෙස අධිකරණය විසින් ආඥා කළ හැකි ය.

එසේ වුවද, සන්තකයේ සිටින සහ ඉඩම් කොටසෙහි හෝ එහි සම්බන්ධතාව වටිනා ප්‍රතිෂ්ඨාවක් සඳහා අත්කර ගෙන ඇති ලියාපදිංචි අයිතිකරුවකුගේ හිමිකමට බලපාන පරිදි රෙජිස්ටරය නිවැරදි කරන ලෙස, අධිකරණය විසින්, ඒ අයිතිකරු ඒ වංචාවට පාර්ශ්වකරුවකු වූයේ නම් මිස, ආඥා නොකළ යුතු ය.

පාඩු හෝ අලාභ දැරීමට සිදු වූ තැනැත්තා හානිපූරණයක් කළ යුතු බව.

60. (1) (අ) මේ පනත යටතේ අධිකරණය විසින් කරන ලද ආඥාවක් අනුව රෙජිස්ටරයේ යම් නිවැරදි කිරීමක් : හෝ

(ආ) 59 වන වගන්තිය යටතේ අධිකරණය විසින් කරන ලද ආඥාවක් අනුව රෙජිස්ටරය නිවැරදි නොකිරීම

හේතුකොටගෙන පාඩු හෝ අලාභ දැරීමට සිදු වූ හෝ අගතියට පත් යම් තැනැත්තකු, අධිකරණය විසින් කරනු ලබන ආඥාවක් මත, රක්ෂණ අරමුදලින් ආණ්ඩුව විසින් හානිපූරණය කරනු ලැබීමට හිමිකම් ලැබිය යුතු ය.

(2) 59 වන වගන්තියෙහි සඳහන් යම් වංචාවක් තමා විසින් ම සිදු කර ඇති හෝ යම් වංචාවක් සිදු කිරීමෙහි ලා සැලකිය යුතු ආකාරයකින් දායක වී ඇති හෝ ඒ වංචාව සිදුකර ඇති හෝ සිදු කිරීමෙහි ලා සැලකිය යුතු ආකාරයකින් දායක වී ඇති තැනැත්තකුගෙන් ස්වකීය හිමිකම ලබා ගන්නා යම් තැනැත්තකුට, මේ පනත යටතේ හානිපූරණය කිරීම වශයෙන් මුදල් කිසිවක් ගෙවනු නොලැබිය යුතු ය.

(3) යම් ඉඩම් කොටසක හිමිකම හෝ යම් ඉඩම් කොටසකට ඇති සම්බන්ධතාව අහිමිවීම හේතුකොටගෙන, හානිපූරණය කිරීම වශයෙන් යම් මුදලක් ප්‍රදානය කරනු ලබන අවස්ථාවක, ඒ මුදල–

(අ) ලේඛනය නිවැරදි කරනු ලැබූ යම් අවස්ථාවක, නිවැරදි කිරීමට පෙරාතුව ම පැවති ඒ ඉඩම් කොටසේ හෝ ඉඩම් කොටස් සම්බන්ධතාවේ වෙළෙඳපොළ වටිනාකම:

(ආ) රෙජිස්ටරය නිවැරදි කරනු නොලැබූ අවස්ථාවක ඒ සම්බන්ධතාවට අදාළ සටහන රෙජිස්ටරයේ ඇතුළත් කළ අවස්ථාවේ දී පැවති ඒ ඉඩම් කොටසේ හෝ ඉඩම් කොටස් සම්බන්ධතාවේ වෙළෙඳපොළ වටිනාකම

නොඉක්මවිය යුතු ය.

(4) හානිපූරණය කිරීම වශයෙන් යම් මුදලක් ප්‍රදානය කර ඇති අවස්ථාවක, ලඝු කාර්ය පටිපාටිය අනුව අධිකරණය වෙත කරනු ලබන ඉල්ලීමක් මත හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින්, ස්වකීය වංචාව හෝ නොසැලකිලිමත් භාවය නිසා පාඩුව සිදුකර ඇති හෝ පාඩුව සිදුකිරීමෙහි ලා සැලකිය යුතු ආකාරයකින් දායක වී ඇති යම් තැනැත්තකුගෙන් එසේ ප්‍රදානය කරන ලද මුදල අයකර ගනු ලැබිය හැකි ය.

ඉඩමේ ප්‍රමාණයේ යම් අතිරික්තයක් හෝ ඌණතාවක් මත හානිපූරණය ගෙවීමට නොමැති බව.

**61.** මිනුම්පතිවරයා විසින් සහතික කරන ලද ඉඩමේ ප්‍රමාණයේ හෝ ඉඩමේ මැනීමේ යම් අතිරික්තයක් හෝ ඌණතාවක් හේතුකොටගෙන හානිපූරණය කිරීම සඳහා කිසිම හිමිකම්පෑමක් උද්ගත නොවිය යුතු ය.

රක්ෂණ අරමුදල.

**62.** (1) ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණය යටතේ හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් කළමනාකරණය කළ යුතු රක්ෂණ අරමුදලක් තිබිය යුතු ය.

(2) රක්ෂණ අරමුදලට අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබූ මේ පනත යටතේ අය කරනු ලබන ගාස්තු බැර කරනු ලැබිය යුතු ය.

(3) 58 වන වගන්තිය යටතේ හානිපූරණය කිරීම සඳහා වූ සියලු ගෙවීම් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

බෙදුම් නඩු පනත අදාළ නොවිය යුතු බව.

**63.** පළමු අයිතියේ ප්‍රථම පංතියේ හිමිකමක් හෝ අයිතිය පිළිබඳ දෙවන පංතියේ හිමිකමක් සහිතව මේ පනත යටතේ ලියාපදිංචි කරන ලද යම් ඉඩම් කොටසක බෙදුම් නඩු පනත අදාළ නොවිය යුතු ය.

වැරදි.

**64.** මේ පනත යටතේ ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමේ දී මිනුම්පතිවරයා, හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා හෝ හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා හෝ ඔවුන්ගේ සහායකයන් හෝ නියෝජිතයන් දැන දැනම නොමග යවන හෝ රවටන යම් තැනැත්තකු වරදට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී එක් අවුරුද්දක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම හා දඩය යන දඬුවම් දෙකට ම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.

රෙජිස්ටර සම්බන්ධයෙන් වූ වැරදි.

65. (අ) යම් උධෘතයක් හෝ වෙනත් ලේඛනයක් වංචනික ලෙස නිකුත් කරන හෝ සාදන හෝ නිකුත් කිරීම හෝ සෑදීම වංචනික ලෙස සලසා ගන්නා හෝ මේ පනත යටතේ පවත්වා ගෙන යනු ලබන යම් රෙජිස්ටරයක හෝ වෙනත් ලේඛනයක් වංචනික ලෙස ලියාපදිංචි කිරීම සිදු කරන හෝ යම් රෙජිස්ටරයක් හෝ වෙනත් ලේඛනයක් මකා දැමීම හෝ වෙනස් කිරීම සිදු කරන ; හෝ

(ආ) ලියාපදිංචි කිරීමේ කාර්යාලයකින් මේ පනත යටතේ පවත්වාගෙන යනු ලබන යම් රෙජිස්ටරයක් හෝ යම් රෙජිස්ටරයක යම් කොටසක් හෝ ඒ ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙහි ගොනු කර ඇති යම් සාධන පත්‍රයක් වංචනික ලෙස ඉවත් කරන ; හෝ

(ඇ) එවැනි යම් රෙජිස්ටරයක් හෝ වාර්තාවෙහි ගොනු කර ඇති සාධන පත්‍රයක් මත හෝ තුළ යම් විකෘති කිරීමක්, මකා දැමීමක් හෝ විරූපි කිරීමක්, බලය නොලත් ඇතුළත් කිරීමක් හෝ වෙනස් කිරීමක් සිදු කිරීමට වංචනික ලෙස සලස්වන

යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු තුනක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් පහළොස් දහසක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම හා දඩය යන දඬුවම් දෙකටම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.

ගාස්තු.

66. මේ පනත යටතේ සාදනු ලබන රීතිවල නියමිතව සඳහන් ගාස්තු ඒ ගාස්තු අදාළ වන කාරණා සඳහා ගෙවනු ලැබිය යුතු ය.

නියෝග.

67. (1) අමාත්‍යවරයා විසින් සාමාන්‍යයෙන් මේ පනතේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ හා විධිවිධාන බලගැන්වීමේ කාර්යය සඳහා ද, නියමිත යයි මේ පනතින් නියම කරන ලද යම් කාරණයක් සඳහා ද, මේ පනත බලාත්මක කිරීමෙහි ලා පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය හා පිළිවෙත් සඳහා ද නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) ඉහත දැක්වෙන විධිවිධානවල ව්‍යාප්තියට හානියක් නොමැතිව–

(අ) සමගි මණ්ඩල පත් කිරීම සහ ඒවායේ ක්‍රියාකාරිත්වය පිළිබඳ කාර්ය පටිපාටිය ;

(ආ) හිමිකම්පෑම් පිළිබඳව විමර්ශන පැවැත්වීම ;

(ඇ) ඉඩම් ඒකාබද්ධ කිරීම සහ නැවත වෙන් කර දීම සඳහා වූ කාර්ය පටිපාටි ;

(ඈ) අවම ආර්ථික ඒකකවල ප්‍රමාණය ;

(ඉ) මේ පනත යටතේ වාර්තා පවත්වාගෙන යාම ;

(ඊ) රක්ෂණ අරමුදල පරිපාලනය කිරීම සහ කළමනාකරණය ;

(උ) මේ පනතේ කාර්ය සඳහා අවශ්‍ය ආකෘති පත්‍ර ; සහ

(ඌ) මේ පනත යටතේ ගෙවිය යුතු ගාස්තු

සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එය එසේ පළ කරනු ලැබූ දිනයේ සිට ක්‍රියාත්මක විය යුතු ය.

(4) සෑම නියෝගයක් ම එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එහි අනනුමතයේ දිනයේ සිට, එහෙත් එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොමැතිව, පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක්, එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

68. (1) යම් රාජ්‍ය ආයතනයක් හෝ පළාත් පාලන ආයතනයක් විසින්, ඒ රාජ්‍ය ආයතනයේ හෝ පළාත් පාලන ආයතනයේ ක්‍රම සැලසුම් පරිපාලනය සහ වෙනත් කටයුතු සඳහා භාවිත කිරීම පිණිස මේ පනතේ විධිවිධාන යටතේ පවත්වාගෙන යනු ලබන රෙජිස්ටර් ප්‍රයෝජනයට ගත හැකි අතර, ඒ රාජ්‍ය ආයතනයට හෝ පළාත් පාලන ආයතනයට ඒ රෙජිස්ටර්වලට ප්‍රවේශයක් ලබා ගත හැකි ය. විවිධ කරුණු.

(2) මේ පනතේ යටතේ පවත්වාගෙන යනු ලබන ලේඛනවල ලියාපදිංචි කර ඇති ඉඩම් සඳහා යම් රාජ්‍ය ආයතනයට හෝ පළාත් පාලන ආයතනයට අයවීමට ඇති ගෙවීම් පිළිබඳ විස්තර, ඒ රෙජිස්ටර්වල ඇතුළත් කරන ලෙස ඒ රාජ්‍ය ආයතනය හෝ පළාත් පාලන ආයතනය විසින් හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ඉල්ලා සිටිය හැකි අතර, ඒ අනුව, හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් ඒ තොරතුරු නියමිත ආකාරයෙන් හිමිකම් රෙජිස්ටර්වල වාර්තා කිරීමට පියවර ගනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ පවත්වාගෙන යනු ලබන රෙජිස්ටර්වල ඉඩමේ ස්වභාවික වස්තුන්ට හා ඉඩමේ කර ඇති යම් සංවර්ධනයකට සහ යම් පරවශතාවකට අදාළ විස්තර ඇතුළත් කරන ලෙස, යම් රජයේ ආයතනයක් හෝ පළාත් පාලන ආයතනයක් විසින් හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ඉල්ලා සිටිය හැකි ය. එවැනි ඉල්ලීමක් ලැබුණු විට හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් ඒ තොරතුරු හිමිකම් රෙජිස්ටරයේ නියමිත ආකාරයෙන් වාර්තා කිරීමට සැලැස්විය යුතු ය.

69. (1) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දැන්වීමක් මගින් අමාත්‍යවරයා විසින් හිමිකම් රෙජිස්ටර පිළියෙල කරනු ලැබ ඇති යම් ප්‍රදේශයක්, ඉඩම් ඒකාබද්ධ කිරීමේ සහ නැවත වෙන් කිරීමේ කාර්ය පටිපාටි ක්‍රියාත්මක වන ප්‍රදේශයක් ඇතුළත පිහිටි ප්‍රදේශයක් බව ප්‍රකාශ කරනු ලැබිය හැකි ය. ඉඩම් ඒකාබද්ධ කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් පළ කරනු ලැබ ඇති අවස්ථාවක, හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා විසින්, ඒ දැන්වීමේ සඳහන් ප්‍රදේශවල, මේ පනත යටතේ සාදන ලද නියෝගය අනුව, ඉඩම් ඒකාබද්ධ කිරීමේ සහ නැවත වෙන්කරදීමේ කාර්ය පටිපාටි හඳුන්වාදීමට පියවර ගනු ලැබිය යුතු ය.

අවම ආර්ථික ඒකක පිළිබඳ ප්‍රතිපත්තිය අදාළ වන ප්‍රදේශ ප්‍රකාශ කරන දැන්වීම.

**70.** (1) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දැන්වීමක් මගින් අමාත්‍යවරයා විසින් හිමිකම් පිළිබඳ රෙජිස්ටර සකස් කරනු ලැබ ඇති ප්‍රදේශයක්, අවම ආර්ථික ඉඩම් කොටස් ඒකක පිළිබඳ ප්‍රතිපත්තිය අදාළ විය යුතු ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

(2) ඉහත (1) වන උපවගන්තිය අනුව දැන්වීමක් පළ කරනු ලැබ ඇති අවස්ථාවක, හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා විසින් මේ පනත යටතේ සාදන ලද නියෝගවලට අනුකූලව කාර්ය පටිපාටි හඳුන්වාදීම සඳහා පියවර ගනු ලැබිය යුතු ය.

පරිගණක යන්ත්‍ර හා සූක්ෂම සේවා පටිගත කිරීමේ පහසුකම් භාවිත කිරීම.

**71.** මේ පනත යටතේ යම් රෙජිස්ටර හා වාර්තා පවත්වා ගෙන යාම සඳහා පරිගණක යන්ත්‍ර හා මයික්‍රෝ සේවා පටිගත කිරීමේ පහසුකම් යොදා ගනු ලැබිය හැකි ය.

නඩු පැවරීමෙන් ආරක්ෂාව.

**72.** මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී හෝ කාර්ය ඉටු කිරීමේ දී, හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයාගේ, මිනුම්පතිවරයාගේ හෝ හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ දෙපාර්තමේන්තුවල යම් නිලධරයකු හෝ සේවා නියුක්තයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන්, ඒ නිලධරයාට හෝ සේවා නියුක්තයාට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

වෙනත් නීති සමඟ ගැටීම.

**73.** වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත් ද, මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු අතර, මේ පනතේ විධිවිධාන සහ වෙනත් යම් නීතියක් අතර යම් ගැටුමක් හෝ අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට මේ පනතේ විධිවිධාන, ඒ වෙනත් නීතිය අභිබවා බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**74.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

75. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි- අර්ථ නිරූපණය.

"සාධන පත්‍රය" යන්නෙන්, යම් ඉඩම් කොටසක හිමිකම් හෝ එහි සම්බන්ධතා සමර්පණය කිරීමේ බලපෑම ඇති නියමිත ආකෘතියේ යම් ලේඛනයක් අදහස් වේ ;

"ඉඩම් කොටසක් කෙරෙහි සම්බන්ධතාව" යන්නෙන්, යම් ඉඩම් කොටසක සම්පූර්ණ අයිතියට වඩා අඩු යම් සම්බන්ධතාවක් අදහස් වන අතර, එයට යම් පරවශතාවක් හෝ ඒ ඉඩම් කොටස විෂයයෙහි බැඳීමක් ඇතුළත් වේ ;

"ඉඩම" යන්නට, ජලයෙන් පිරුණු ඉඩමක් සහ යම් ඉඩමකින් උද්ගතවන යම් ප්‍රතිලාභයක්, පොළොවට සම්බන්ධ හෝ පොළොවට ස්ථිරව සවි කර ඇති සියලු දේ ඇතුළත් වේ;

"බලයලත් වෙන්දේසිකරු" යන්නෙන්, (109 වන අධිකාරය වූ) වෙන්දේසිකරුවන්ගේ හා තැරැව්කරුවන්ගේ ආඥා පනත යටතේ බලයලත් වෙන්දේසිකරුවකු අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, ඉඩම් පිළිබඳ විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා අදහස් වේ;

"අයිතිකරු" යන්නෙන්-

(අ) එය ඉඩම් කොටසක් සම්බන්ධයෙන් යෙදෙන විට, එහි අයිතිකරු ලෙස හිමිකම් රෙජිස්ටරයේ නම් කර ඇති තැනැත්තා ; සහ

(ආ) එය ඉඩම් කොටසකට ඇති සම්බන්ධතාව සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ සම්බන්ධතාව හිමිකම් රෙජිස්ටරයේ ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකුගේ නමින් ද, ඒ තැනැත්තා

ඉන් අදහස් වේ;

"ඉඩම් කොටස" යන්නෙන් කැඩැස්තර සිතියමේ වෙන්ව රූප රේඛනය කර ඇති ඉඩම් ප්‍රදේශයක් අදහස් වේ;

"හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා" යන්නට, යම් නියෝජ්‍ය හෝ සහකාර හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර්

ජනරාල්වරයකු ඇතුළත් වේ:

"හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා" යන්නෙන්, මේ පනත යටතේ හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයකු ලෙස පත් කරන ලද යම් තැනැත්තකු අදහස් වේ:

"ලියාපදිංචි කළ ඉඩම් කොටස" යන්නෙන් මේ පනත යටතේ හිමිකම ලියාපදිංචි කරනු ලැබුවේ යම් ඉඩම් කොටසක ද, ඒ ඉඩම් කොටස අදහස් වේ:

"පරවශතාව" යන්නෙන්, වෙනත් තැනැත්තකුට අයත් ඉඩම් කොටස විෂයෙහි යම් තැනැත්තකු විසින්, භුක්ති විඳින යම් අයිතිවාසිකමක් අදහස් වේ:

"මිනුම්පතිවරයා" යන්නෙන්, ශ්‍රී ලංකාවේ මිනුම්පතිවරයා ලෙස පත් කරන ලද නිලධරයා හෝ ලියවිල්ලකින් වූ පත් කිරීමේ ලිපියක, ඒ පත් කිරීමේ ලිපියේ නිශ්චිතව සඳහන් ප්‍රමාණයට මේ පනතේ කාර්යය සඳහා ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීම පිණිස පත් කරන ලද වෙනත් යම් නිලධරයකු අදහස් වේ:

"මිනුම් අධිකාරිවරයා" යන්නෙන්, මිනුම්පති දෙපාර්තමේන්තුවේ මිනුම් අධිකාරිවරයකුගේ කර්තව්‍ය ඉටු කරන යම් තැනැත්තකු අදහස් වේ:

"හිමිකම් රෙජිස්ටරය" යන්නෙන්, මේ පනතේ විධිවිධාන යටතේ පවත්වා ගෙන යනු ලබන හිමිකම් රෙජිස්ටරය අදහස් වේ.